සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/05/08/01/ චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2025.03.14

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2025/06
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති කළමණාකාර තනතුරේ වැඩබලන/වැඩ ආවරණය කරන නිලධාරින්ට දීමනාවක් ලබාදීම.</u>**

2025.02.25 දින පැවති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 134 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද, මාණ්ඩලික පත්‍රිකා අංක 2025/134/10 හා 12 සඳහා ලබාදුන් තීරණ මත මෙම චක්‍රලේඛය නිකුත් කරන බව දන්වමි.

02.සමෘද්ධි බැංකු හා බැංකු සමිති විසින් පහත සඳහන් නිලධාරින්ට මාසිකව දීමනාව ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමි.මාසික දීමනාව සඳහා සුදුසුකම් ලබන නිලධාරින් වන්නේ

2.1 සමෘද්ධි බැංකුවක/ බැංකු සමිතියක කළමණාකාර තනතුරක වැඩබලන වැඩ ආවරණය කරන උපාධිධාරි සමෘද්ධි සංවර්ධන නිලධාරින් මෙම තනතුරට දෙපාර්තමේන්තුව විසින් පත් කිරීමක් සහිත නිලධාරියකු විය යුතුය.

2.2.සමෘද්ධි කළමණාකාර තනතුරේ සිට කළමණාකරු පුරප්පාඩු බැංකුවක/බැංකු සමිතියක වැඩබලන කළමණාකරුවන්

2.3. බැංකු සමිතියක ව්‍යාපෘති කළමණාකරු තනතුරෙහි වැඩබලන/වැඩ ආවරණය කරන උපාධිධාරී සමෘද්ධි සංවර්ධන නිලධාරින්

3. මාසික දීමනාවෙහි වටිනාකම

3.1. සමෘද්ධි බැංකුවක / බැංකු සමිතියක කළමණාකාර තනතුරේ වැඩ බලන/වැඩ ආවරණය කරන උපාධිධාරි සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා,

*ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය තුල පිහිටි බැංකුවක/බැංකු සමිතියක නම් - රු.4000/-

* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත වෙනත් දිස්ත්‍රික්කයක පිහිටි බැංකුවක/බැංකු සමිතියක නම් රු.7000/-

3.2.නිත්‍ය සමෘද්ධි කළමණාකරුවකු, දිස්ත්‍රික් පුරප්පාඩු පවතින සමෘද්ධි බැංකුවක/බැංකු සමිතියක කළමණාකාර තනතුරේ වැඩබලන කළමණාකරුවකු ලෙස කටයුතු කරන විටක මාසිකව ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 12:6:1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව තම නිත්‍ය තනතුරේ වැටුපට අමතරව,වැඩබලන තනතුරට අයත් ආරම්භක වැටුපෙන්1/4 ක දීමනාවක් 2025.12.31 දින දක්වා ඔබ වෙත ගෙවනු ලබන බව දන්වා සිටිමි.

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

3.3. සමෘද්ධි බැංකු සමිතියක ව්‍යාපෘති කළමණාකරු තනතුරේ වැඩබලන/වැඩ ආවරණය කරන උපාධිධාරි සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට මාසිකව,
*ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය තුල පිහිටි බැංකු සමිතියක නම් - රු.4000/-
* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත වෙනත් දිස්ත්‍රික්කයක පිහිටි බැංකුවක/බැංකු සමිතියක නම් රු.7000/-

3.4. ඉහත සඳහන් නිලධාරින් හැර වෙනත් නිලධාරියෙකු වෙනත් තනතුරක වැඩ බලන/වැඩ ආවරණය කරන්නේ නම්, ඔහු/ඇයට මෙම දීමනාවන් හිමි නොවේ.

04. ගිණුම් සටහන්

4.1. මෙම දීමනාව ලැබීමට නම්, මාසය පුරා වැඩකල යුතු අතර, වැඩ බලන/වැඩ ආවරණය කිරීමේ පත්වීම් ලිපියක් තිබිය යුතුය.

4.2. අදාල තනතුරෙහි රාජකාරි කරන ස්ථානය සතු බැංකු/බැංකු සමිති අරමුදලින් දීමනාව ලබාගත යුතුය. ඒ සඳහා පොදු 35 ආකෘතියක් භාවිතා කර දීමනාව ඉල්ලුම් කල යුතුය.

4.3. ගිණුම් සටහන් පත්‍රයේ,

<u>බැංකු සමිතියක</u>

වැය ගිණුම - කාර්යය මණ්ඩල දීමනා හා ගමන් වියදම් - හර (කේත අංක 6203)
මුදල්/ ශ්‍රම ශක්ති ඉතිරි කිරීම් ගිණුම - බැර

<u>සමෘද්ධි බැංකුවක</u>

වැය ගිණුම - කාර්යය මණ්ඩල දීමනා හා ගමන් වියදම් - හර (කේත අංක 2113)
මුදල්/ සාමාජික නොවන/දිරියමාතා ඉතිරි කිරීම් ගිණුම - බැර

05. දීමනාව සඳහා වලංගු කාලය

5.1. අනුමත මාසික දීමනාව 2025.01.01. දින සිට 2025.06.30 දක්වා වලංගු වේ.

5.2. සමෘද්ධි බැංකු/ බැංකු සමිතියක පුරප්පාඩු පවතින බැංකු / බැංකු සමිති කළමණාකාර තනතුරට අනුමත මාසික දීමනාව 2025 වසරේ පසුගිය මාස 02 ට ද ගෙවීමට අවසර ලබාදේ.

5.3. ව්‍යාපෘති කළමණාකාර තනතුරේ යම් උපාධිධාරි සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු විසින් වැඩ බලන/වැඩ ආවරණය කරන විටක එම නිලධාරින්වද 2025.01.01 දින සිට 2025.06.30 දින දක්වා දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි. තවද, 2024 වසර තුලද මෙම තනතුරේ රාජකාරි ඉටුකර ඇත්නම් පත්වීම් ලද දින සිට 2024.12.31 දින දක්වා පසුගිය මාසය සඳහාද දීමනාව ලබාගත හැක.

06. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිලධාරින්ට වැඩ බලන/වැඩ ආවරණය කිරීම සඳහා දීමනාවක් ලබාදෙන අවස්ථාවක මෙම දීමනාව සඳහා අදාල නිලධාරියා සුදුසුකම් නොලබන බවද දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය -කා.දැ.පි.
2. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
   - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පාලන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි හා .අ.ක.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
6. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
7. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.පි.